Seafood Exporters' Association of Sri Lanka
SEASL

# නිල් කකුළුවෝ පුවත් හසුන අංක 04

**2015 ජුලි සිට දෙසැම්බර් දක්වා**

ශ්‍රී ලංකා ජනතාව ආහාරයට ගන්නා මුහුදු මත්ස්‍ය අපනයනකරුවන්ගේ සංගමයේ (SEASL) නිල් කකුළුවෝ පුවත් හසුන අංක 4 ඔබට පිළිගනිමු. ධීවර සංවර්ධන ව්‍යාපෘතිය (FIP) ගත වූ හය මසක කාලය තුළ සතුටුදායක දියුණුවක් ලබා ඇති අතර එමගින් ශ්‍රී ලංකා නිල් කකුළුවන්ගේ ජීව විද්‍යාත්මක හා පාරිසරික තත්වයන් වර්ධනය කිරීම සඳහා උප ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කොට ඇත. ධීවර සංවර්ධන ව්‍යාපෘතිය (FIP) මගින් "දිගුකල් පවතින මුහුදු මාළු සම්පත් " සඳහා වූ ජාත්‍යන්තර මූල්‍යපත්‍රවලට අනුව ජීව විද්‍යාත්මක හා පාරිසරික තත්වයන් පවත්වාගෙන යනු ලබන ධීවර විශේෂිත කළමනාකරණ පියවර කීපයක් ගෙන ඇත.

ගත වූ හය මසක කාලය තුළ ජාතික ජලජ සම්පත් සංවර්ධන හා පර්යේෂණ නියෝජ්‍යායතනය වන නාරා (NARA) විසින් වර්ෂයක කාලයක් තුළ ශ්‍රී ලංකා නිල් කකුළුවන් ගේ සංගහන ජීවී විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කොට ඇත. ආචාර්ය ජෙරමි ප්‍රින්ස් හා ආචාර්ය ඒඩ්‍රියන් හෝර්ඩයික් විසින් තාක්ෂණික සහයෝගීතාව හා දිරිගැන්වීම් ලබා දෙමින් අධීක්ෂණයක් සිදු කරන ලදි. ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාල සිසුන් විසින් සිය අවසන් වර්ෂ පර්යේෂණ ව්‍යාපෘති සම්පූර්ණ කරන ලද අතර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා නිල් කකුළු වන් අල්ලන ප්‍රජාව විසින් ප්‍රථම වරට මාළු ඇල්ලීමේ ප්‍රයත්නයෙහි තක්සේරුවක් කරන ලදි. වර්ෂාවසානයේදී ධීවරයින්ගේ සමූපකාර සංගම් විසින් ශ්‍රී ලංකා මුහුදෙහි තමිල් නාඩු ට්‍රෝලර් යාත්‍රා මගින් අනීතික වාර්තා නොකළ හා නියාමනය නොකළ මසුන් ඇල්ලීමට විරෝධී උද්ඝෝෂණ දියත් කරන ලදි. නිල් කකුළුවෝ පුවත් හසුනේ මෙම සංස්කරණයෙහි මේ ක්‍රියාදාමයන්ගේ සියලු විස්තර දැන ගත හැක.

## මත්ස්‍ය තොගයේ ජීව විද්‍යාත්මක තත්ව වැඩි දියුණු කිරීම



නාරා ආයතනයේ මුහුදු සම්පත් කළමණාකාරීත්ව අංශයේ ප්‍රධාන විද්‍යාඥ ආචාර්ය සිසිර හපුතන්ත්‍රි මහතා සහ සිය සේවක මණ්ඩලය විසින් ශ්‍රී ලංකා නිල් කකුළුවන් පිළිබඳ සංගහන ජීව විද්‍යාත්මක අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර දත්ත රැස් කිරීමේ කාර්යය 2015 දෙසැම්බර් මාසයේ දී අවසන් කොට ඇත. ගත වූ 12ස් මස ඇතුළත යාපන දිස්ත්‍රික්කයේ මාළු ගොඩබාන ස්ථානවලින් නිල් කකුළුවන් 35,000කට අධික සංඛ්‍යාවක් අධ්‍යයනය කරන ලදි. නාරා ක්ෂේත්‍ර වැඩසටහන සම්බන්ධීකරණය කරනු ලැබූයේ උතුරු පළාතේ ශ්‍රී ලංකා මුහුදු මත්ස්‍ය අපනයනකරුවන්ගේ සංගමයේ ක්ෂේත්‍ර සම්බන්ධීකරණ නිලධාරී වූ තේව සුදර්ශන් විසිනි.

නාරා පර්යේෂණ කණ්ඩායම විසින් මාසිකව එකතු කරගනු ලබන නියැදි රසායනාගාරයේ දී නාරා පර්යේෂණ නිලධාරීන් විසින් විශ්ලේෂණය කරනු ලැබේ. පර්යේෂණ තුළින් නාරා ආයතනය විසින් ස්ථාපිත කරනු ලබන ප්‍රධාන සංගහන ජීව විද්‍යාත්මක පරාමිතියට ඇතුළත් වන්නේ නිල් කකුළු පිරිමි / ගැහැණු දිග / බර සම්බන්ධතාව, වර්ධනය, මැරෙන සංඛ්‍යාව, මෝරා වැඩුණු පසු ප්‍රමාණය, දරුපලදාව, බිත්තර දැමීමේ කාලය සහ ආහාරයි.

බෙන්ගාල බොක්කේ ශ්‍රී ලංකා නිල් කකුළු ජීව විද්‍යා සංගහන, නාරා ආයතනයේ අවසන් වාර්තාව SEASL සංගමය වෙත 2016 වර්ෂයේ පෙබරවාරි මාසය තුළ දී ඉදිරිපත් කරනු ඇත. ශ්‍රී ලාංකික නිල් කකුළුවන් පිළිබඳ ප්‍රථම වරට ප්‍රකාශනය වන මෙම විද්‍යාත්මක අධ්‍යයනයේ සොයා ගැනීම් ඊළඟ නිල් කකුළුවෝ පුවත් හසුනේ ඉදිරිපත් කරනු ලැබේ.

සීමා සහිත බයෝස්ෆියරික් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ආචාර්ය ජෙරමි ප්‍රින්ස් සහ බටහිර ඕස්ට්‍රේලියාවේ මර්ඩොක් විශ්ව විද්‍යාලයේ ධීවර සහ ධීවර පර්යේෂණ කේන්ද්‍රයේ ආචාර්ය ඒඩ්‍රියන් හෝර්ඩයික් විසින් දිග ප්‍රමාණය පදනම් වූ බිත්තර දැමීමේ කාල විභව්‍යතාවය පිළිබඳව නාරා ආයතනයෙහිදී ජාතික සම්මන්ත්‍රණයක් සහ තාක්ෂණික වැඩමුළුවක් ගිය අගෝස්තු මාසයේ දී පවත්වනු ලැබීය. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයන්හි කළමනාකරණ අංශයේ සේවකයන් සමඟ මසුන්ගේ විශාලත්වය තෝරා ගනිමින් අස්වැන්න නෙලා ගැනීමේ පාලන ක්‍රමෝපායයන් පිළිබඳ පැවති සාකච්ඡාවකටද ඔවුහු සහභාගී වූහ. දිග ප්‍රමාණය පදනම් බිත්තර දැමීමේ විභව්‍යතාවය උපයෝගී කර ගනිමින් දත්ත අඩු මසුන් අභිජනන මධ්‍යස්ථානවල මත්ස්‍ය තොග තත්වයන් ඇගයීමේ දී නිල් කකුළු ජීවිත ඓතිහාසික පරාසයක් වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරන සහයෝගීතා තත්වය දෙසැම්බර් මාසය තුළ දී ධීවර සංවර්ධන ව්‍යාපෘතිය විසින් ආචාර්ය ප්‍රින්ස් හා ආචාර්ය හෝර්ඩයික් සමඟ තව දුරටත් සාකච්ඡා පවත්වා ගෙන යන ලදි.



නිල් කකුළුවන් ගැන විද්‍යාත්මක අධ්‍යයන ප්‍රකාශන සමීක්ෂණයේ දී හා විග්‍රහයේ දී ධීවර සංවර්ධන ව්‍යාපෘතිය මගින් යොදාගත් එක් එක් නිල් කකුළු ඓතිහාසික ජීවිත පරාමිතය පිළිබඳ පූර්ව නිල් කකුළු ජීවිත පරාමිත තක්සේරු කිරීම් පහත සඳහන් අයුරු වේ.

| ඓතිහාසික ජීවන පරාමිතය | සංකේතය | පූර්ව | සංශෝධන |
|---|---|---|---|
| මරණ සංඛ්‍යාව වර්ධන අනුපාතය | M/k | 1.50 | 1.34 |
| 50%ක මේරුම් කාල ප්‍රමාණය | $L_{50}$ | 95 mm | 100 mm |
| 95%ක මේරුම් කාලය | $L_{95}$ | 135 mm | 135 mm |
| සාමාන්‍ය උපරිම කාල ප්‍රමාණය | $L_{inf}$ | 170 mm | 180 mm |
| වයස සමඟ පැටව් ඵලදාව | β | 3.0 | 3.0 |

ඉන් අනතුරුව මෙම අගයන් යොදා ගනු ලැබුයේ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානවල බිත්තර දැමීමේ විභව්‍ය තැන් සංශෝධිත අනුපාත මන්නාරම් මුහුදු බොක්කේ නිල් කකුළුවන් යාවත් කාලීන කිරීමේ ක්ෂණික ගණනය කිරීම වාර්තාගත යෙදුමක් උපයෝගී කර ගනිමින් ''අල්ලාගත් ප්‍රමාණය කුමක්ද?'' යන ආචාර්ය හෝර්ඩයින් විසින් නිකුත් කරන ලද ඉතා ආසන්න විග්‍රහයට අනුව බිත්තර දැමීමේ විභව්‍ය අනුපාතය මුල්දී තක්සේරු කරන ලද මන්නාරම් බොක්කේ හා බෙංගාල බොක්කේ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානවලට වඩා අඩු තත්වයක පවතී. මීට ප්‍රධාන හේතුව වන්නේ ගැහැණු මත්ස්‍යයින්ගේ සාමාන්‍ය උපරිම ප්‍රමාණය වඩා වැඩියෙන් ඇස්තමේන්තු කිරීමේ හේතුවෙනි. කෙසේ හෝ මන්නාරම් බොක්කේ හා බෙංගාල බොක්කේ නවීනතම බිත්තර දැමීමේ විභව්‍යතාව තවමත් අඩු ඉලක්ක යොමු අංකවලට වඩා ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යා හැකි අයුරින් මත්ස්‍ය පැටව් අභිජනනය කිරීමේ ඉලක්ක යොමුලක්ෂයන්ට වඩා අඩු තත්වයකට වරල් ධීවර සංවර්ධන ව්‍යාපෘතිය දිගුකාලීනව කළමනාකරණය කළ හැක.

| | මන්නාරම බොක්කේ නිල් කකුළු අභිජනන මධ්‍යස්ථාන | බෙන්ගාල බොක්කේ නිල් කකුළු අභිජනන මධ්‍යස්ථාන |
|---|---|---|
| පහළ ඉලක්ක යොමු අංක | එස්පීආර් SPR = 30% | එස්පීආර් SPR = 30% |
| ඉහළ ඉලක්ක යොමු අංක | එස්පීආර් SPR = 40% | එස්පීආර් SPR = 40% |
| 2015 මත්ස්‍ය තොග තත්වය | එස්පීආර් SPR = 36% | එස්පීආර් SPR =37% |
| කළමනාකරණය කිරීමේ දිස්ත්‍රික්ක | *2016 දී ''ධීවර ප්‍රයත්නය'' ඒ අයුරින්ම තිබිය යුතුයි පුත්තලම* | *2016 දී ''ධීවර ප්‍රයත්නය'' ඒ අයුරින්ම තිබිය යුතුයි මන්නාරම, කිලිනොච්චි, යාපනය* |



ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ අවසන් වර්ෂයේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවක වන අයන්තා අබේගුණවර්ධන මන්නාරම් දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා නිල් කකුළුවන්ගේ ප්‍රජනන ජීවී විද්‍යා අධ්‍යාපන ක්ෂේත්‍ර කටයුතු දෙසැම්බර් මාසයේ දී සම්පූර්ණ කරන ලදි. ඇය අධීක්ෂණය කරනු ලැබූයේ ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ ජල ජීවී සම්පත් හා අපනයන නිෂ්පාදන පීඨයේ පීඨාධිපති ආචාර්ය සේපාලිකා ජයමාන්න විසිනි. අයන්තාගේ අවසාන වාර්තාව හා පර්යේෂණ නිබන්ධය වන බෙංගාල බොක්කේ නිල් කකුළුවන්ගේ ප්‍රජනනය පිළිබඳ ජීව විද්‍යාත්මක අධ්‍යයනය 2016 මාර්තු මාසයේ දී ප්‍රකාශයට පත් කරනු ලැබේ. ඇගේ සොයා ගැනීම් මීළඟ නිල් කකුළුවෝ පුවත් හසුනේ පල කරනු ලැබේ.

## මත්ස්‍ය අභිජනන ස්ථානවල පාරිසරික තත්ව වැඩි දියුණු කිරීම



ඉලක්ක නොකරන ලද ජාතීන් (එනම් අතුරු අල්ලා ගැනීම්) පිළිබඳ මුහුදු ජීවයක ප්‍රධාන ස්වභාවික වාස භූමි (එනම් කඩොලාන, කොරල් පර හා මුහුදේ තණ තට්ටුව) සහ මන්නාරම් බොක්කේ හා බෙංගාල බොක්කේ පුළුල් මුහුදු ජෛව ප්‍රජාව නිල් කකුළු අභිජනන මධ්‍යස්ථානවල පවත්නා ජීවත් වීමට අත්‍යවශ්‍ය ඉඩ ප්‍රමාණයේ තත්වය වැඩි දියුණු කිරීම උදෙසා ගත යුතු ඉතාමත් තීරණාත්මක පියවර වේ.

ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ අවසන් වසර ශිෂ්‍යයෙකු වන වත්සල දොලවත්ත විසින් ඔහුගේ අවසන් වසර අධ්‍යයනය ලෙස කල ඉලක්ක නොකළ මත්ස්‍ය වර්ග කෙරෙහි ශ්‍රී ලංකා නිල් කකුළු අභිජනන මධ්‍යස්ථාන වල බලපෑම වන පර්යේෂණ වාර්තාව 2015 දෙසැම්බර්මාසයේදී සම්පූර්ණ කරන ලදී. ඔහුද අධීක්ෂණය කරනු ලැබුවේ ඌවවෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ ජල ජීවි සම්පත් හා අපනයන නිෂ්පාදන පීඨයේ පීඨාධිපති ආචාර්ය සේපාලිකා ජයමාන්න විසිනි.


වත්සල ගේ බෙංගාල බොක්කේ ඉලක්ක නොකල මත්ස්‍ය වර්ග කෙරෙහි ශ්‍රී ලංකා නිල් කකුළු අභිජනන මධ්‍යස්ථානවල බලපෑම පිළිබඳ අවසන් වාර්තාව හා පර්යේෂණ නිබන්ධය 2016 මාර්තු මාසයේදී ප්‍රකාශනය කරනු ලැබේ. ඔහුගේ සොයා ගැනීම් මීළඟ නිල් කකුළුවෝ පුවත් හසුනේ පල කරනු ලැබේ.

# ශ්‍රී ලංකා නිල් කකුළු අභිජනන කළමනාකාරිත්වය වැඩි දියුණු කිරීම

ශ්‍රී ලාංකික ධීවර සංවර්ධන ව්‍යාපෘතිය පාලනය කොට කළමනාකරණය කිරීම සඳහා පරිපූර්ණ නීති හා රෙගුලාසි කට්ටලයක් ඇති අතර එය ප්‍රයෝජනයට ගනු ලැබේ. කෙසේ හෝ වුවද මේ දක්වා ශ්‍රී ලංකා නිල් කකුළුවන්ට විශේෂිත වූ නීති රීති පද්ධතියක් සකස් කොට නොමැත.



මෙය අවධානය යොමු කළ යුතු වන ප්‍රධාන අංශයක් වන අතර ඒ පිළිබඳව ශ්‍රී ලංකා නිල් කකුළු ධීවර සංවර්ධන ව්‍යාපෘතිය දියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් 2016 වර්ෂයේ දී පියවර ගනු ලැබේ. 2015 වර්ෂයට විශේෂිත නීති හා රෙගුලාසි කට්ටලයක් සකස් කිරීම සඳහා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ නිලධාරීන් හා කාර්ය මණ්ඩලය වැදගත් පියවරක් ගන්නා ලදි. මන්නාරම් බොක්කේ හා බෙන්ගාල බොක්කේ නිල් කකුළු අභිජනන මධ්‍යස්ථානවල ''මසුන් ඇල්ලීමේ ප්‍රයත්න'' පිළිබඳ පළමු වරට ධීවර කර්මාන්ත අමාත්‍යාංශය මගින් සමීක්ෂණයක් සිදු කොට නිම කරන ලදි. ''මසුන් ඇල්ලීමේ ප්‍රයත්න'' පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵල ඔක්තෝබර් හා නොවැම්බර් මාසවල දිස්ත්‍රික්ක මට්ටමින් හා කොළඹ පවත්වන්නට යෙදුන වැඩමුළු මගින් ධීවර ප්‍රජාව, මුහුදු මත්ස්‍ය ආහාර සමාගම් හා නාරා ආයතනය අතර බෙදා ගන්නා ලදි. නිල් කකුළු ධීවර ප්‍රජාවන් විසින්ද එක් එක් නිල් කකුළු අභිජනන මධ්‍යස්ථානවල ''මත්ස්‍ය ඇල්ලීමේ ප්‍රයත්නය'' පිළිබඳව ඔවුන්ගේම තක්සේරුවක් සිදුකර ඇත. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු සමීක්ෂණයේ හා ධීවර සමූපකාර සමිතිවල සමීක්ෂණ ප්‍රතිඵල ධීවර ප්‍රජාවන් හා ධීවර අමාත්‍යාංශයේ සේවක මණ්ඩලය සමඟ 2016 වර්ෂයේ දී සාකච්ඡාවට ගනු ලැබේ. මෙම සාකච්ඡා වලින් මතු වන තීරණ ශ්‍රී ලංකා නිල් කකුළු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානවලට විශේෂිත නීති හා රෙගුලාසි කට්ටලයක් සකස්කර ගැනීම සඳහා යොදා ගනු ලැබේ.




ශ්‍රී ලංකා නිල් කකුළු අභිජනන මධ්‍යස්ථාන දියුණු කිරීමේ ප්‍රයත්නයට බාධා කෙරෙන ප්‍රධාන බාහිර සාධකය වී ඇත්තේ තමිල්නාඩු ට්‍රොලර් යාත්‍රා හා එරට බෝට්ටු මගින් ශ්‍රී ලංකා මුහුදු තීරයේ කෙරෙන අනීතික වාර්තා නොකල හා නියාමනය නොකළ මසුන් ඇල්ලීමයි (IUU Fishing). මෙම ප්‍රශ්ණය නිසා ශ්‍රී ලාංකික ධීවරයින්ට සතියේ දින තුනක මසුන් ඇල්ලීමට නොහැකි වේ (වම් පස බලන්න). මෙනිසා නිල් කකුළු අභිජනන මධ්‍යස්ථාන කළමනාකරණය දියුණු කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමට ශ්‍රී ලංකා ධීවර ප්‍රජා පසුබට වේ. ශ්‍රී ලංකා සමූපකාර මහ සංගමයයේ නායකයින් තිදෙනෙකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ අභියාචනය නැවත ද 2015 ඔක්තෝම්බර් 15 වැනි දිනට කල් තබා ඇති අතර නැවතත් එය 2016 ජනවාරි 20 වන දින දක්වා කල් තබා ඇත. මෙම ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට එරෙහි ලාංකික ධීවරයින්ගේ නීතිපතිට විරුද්ධව ඉදිරිපත් කළ පෙත්සම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව ශ්‍රී ලංකා මුහුදේ අනීතික ලෙස තමිල්නාඩු ට්‍රොලර් යාත්‍රා මාළු ඇල්ලීම නතර කිරීම සඳහා සුදුසු නොවන ක්‍රියා මාර්ගයක් ගැනීම සඳහා ශ්‍රී ලංකා ධීවරයින් අභියාචනයක් ඉදිරිපත් කොට ඇත.

ශ්‍රී ලංකා මුහුදේ තමිල්නාඩු යාත්‍රා මගින් අනීතික වාර්තා නොකළ නියාමනය නොකළ මසුන් ඇල්ලීම පිළිබඳව ඊට එරෙහිව ශ්‍රී ලාංකික සිවිල් සමාජ සංවිධාන මගින් ශ්‍රී ලාංකික ධීවරයින්ගේ නවතම සහයෝගය දැක්වීම සඳහා ජූනි මාසයේ දී මුහුණු පොතේ (Facebook හි) පිටුවක් දියත් කරනු ලැබීය. STOP Indian Trawlers නමැති මෙම මුහුණු පොත් පිටුවේ තමිල්නාඩු ට්‍රෝලර් යාත්‍රා සම්බන්ධයෙන් දෛනිකව සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් තොරතුරු යාවත්කාලීන කරනු ලැබේ.



ඔක්තෝම්බර් මාසයේ දී යාපනයේ කිලිනොච්චියේ සහ මන්නාරමේ සහ මුලතිව් හි ( සමූපකාර මහ සංගම් හි නායකයින් වන අන්තෝනි එමිලියන් පිල්ලේ, ඇන් ඇම් ආලම්, ජෝෂප් ෆ්‍රැන්සිස් සහ මරියදාස වන මහතුන් විසින් ශ්‍රී ලංකා මුහුදේ අනීතික වාර්තා නොකළ සහ නියාමනය නොකළ තමිල්නාඩු ට්‍රෝලර් යාත්‍රා මගින් මසුන් ඇල්ලීම වහාම නතර කරන ලෙස ඉල්ලා අත් පත්‍රිකා පෝස්ටර් හා තැපැල් පත් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා ජනාධිපති, අගමැති, විරුද්ධ පක්ෂයේ නායක, ධීවර ඇමති හා ප්‍රධාන ඇමති වෙත තැපැල් පත් 13,000 ක් යවන ලදී. තවද ඇමරිකානු එක්සත් ජනපදයේ, එක්සත් රාජධානියේ හා යුරෝපා සංගමයේ තානාපති කාර්යාල ප්‍රධානීන් වෙතද මෙම තැපැල් පත් යවා ඇත.



මන්නාරම් දිස්ත්‍රික්කයේ තමිල්නාඩු ට්‍රෝලර් යාත්‍රා නිසා ධීවරයින්ට වන කුඩා පරිමානයේ ආර්ථික බලපෑම් පිළිබඳව ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය අන්පාන් සූසේ විසින් කරන ලද අධ්‍යයනය අවසන් කොට ඇත. ඔහු අධීක්ෂණය කරනු ලැබුයේ ජලජ සම්පත් හා අපනයන අස්වැන්න හා තාක්ෂණය පිළිබඳ පීඨයේ කථිකාචාර්ය ඉන්දිකා වික්‍රමරත්න මහත්මිය විසිනි.

මන්නාරම් දිස්ත්‍රික්කයේ සුළු පරිමාන ධීවර ජනතාවට සිදු වන ආර්ථික බලපෑම් පිළිබඳ පර්යේෂණ නිබන්ධනය 2016 මාර්තු මාසය තුළ ප්‍රකාශයට පත් කරනු ලැබේ. නිබන්ධනයෙන් සොයාගත් කරුණු ඊළඟ නිල් කකුළුවෝ පුවත් හසුනේ සාකච්ඡාවට භාජනය කිරීමට නියමිතය.

# සාමාජික හා ආර්ථික සාධාරණත්වය



ධීවර සංවර්ධන ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීමේ දී ජාත්‍යන්තර චාරිත්‍ර හා රීති අනුව ප්‍රමාණවත් පරිදි ප්‍රභවයකින් යුත් මුහුදු මත්ස්‍ය ආහාර තිරසාර කලමනාකාරිත්වයකින් යුත් ධීවර සංවර්ධන ව්‍යාපෘතිය හා සම්බන්ධිත සාමාජික හා ආර්ථික ගැටළු පිළිබඳව අවධානය යොමු කළ යුතුව ඇත. ශ්‍රී ලංකා නිල් කකුළු ධීවර සංවර්ධන ව්‍යාපෘතිය දියුනු කිරීමේ සාමජිකයෝ (එනම් නිශ්පාදකයින්, සකස් කරන්නාවුන් හා නියාමනය කරන්නවුන් ධීවර සංවර්ධන ව්‍යාපෘතිය වන දිගු කාලීන පැවැත්ම තහවුරු කෙරෙන ජීව විද්‍යාත්මක හා අවශ්‍ය ඉඩම් ප්‍රමාණ්‍ය පිළිබඳ තත්වයන් හා සහභාගිත්ව කලමනාකරණ ක්‍රියාවන් වැඩි දියුණු කිරීමේ හේතුවෙන් ඇති වන සියලු ප්‍රතිලාභ නිල් කකුළු ධීවර ප්‍රජාව, නිල් කකුළු නිෂ්පාදකයන් (හා සිය සේවකයින්) සහ ශ්‍රී ලංකා රජය අතර සාධාරණ ලෙස බෙදී යාම තහවුරු කිරීමට ඔවුහු බැඳී සිටිති.

ගත වූ හයමසක කාලය තුළ පූනාකරේ ධීවර සමූපකාර සමිති සංගමය විසින් මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානවල සමාජ හා ආර්ථික සාධාරණත්වය වැඩිදියුණු කිරීම සඳහා උප ව්‍යාපෘති 2 ක් සාර්ථකව නිම කරන ලදී. පළමුවෙන්ම පූනාකරෙහි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කලමනාකාරිත්වය ක්ෂුද්‍ර ව්‍යවසායකත්ව සංවර්ධන ධාරිතාව ධීවර සමපූකාර සමිති 11 කට සමූපකාර පොත්කට්ටල හා බැංකු ආධාර ලබා දෙමින් දියුනු තත්වයකට පත් කරන ලදී. ධීවර සමූපකාර සමිති 16 ම ධීවර සමූපකාර මහා සංගමය මගින් ''ක්‍රියාකාරී'' වශයෙන් වර්ගීකරණය කොට ඇත. පූනාකරේ සමූපකාර මහා සංගමය යටතේ ඇති සියලුම ධීවර සමූපකාර සමිති පොත් පවත්වාගෙන යාම සඳහාත් පරිපාලන කටයුතු සඳහාත් හා සාමාජිකයන් වෙත එක් සේවාවක් හෝ ලබා දීම සඳහාත් ලිපිකරුවන් සේවයේ යොදවාගෙන ඇත. ධීවර සමූපකාර සමිති 11 අතරින් ඉතා සාර්ථකව කටයුතු කරන ඉහල මට්ටමේ ධීවර සමූපකාර සමිති 6 ක් සඳහා ධීවර සමූපාකාර සමිති මගින් ධීවර අංශයට අදාළ ක්ෂුද්‍ර අංශය සඳහා මූල්‍ය ආධාර හා පුහුණුවීම් ලබාදෙන ලදී. මෙම ධීවර සමූපකාර සමිති 6 ම දැනට කිසියම් ආකාරයක හෝ ධීවර කයටුතු හා සම්බන්ධ ක්ෂුද්‍ර ව්‍යවසායන්හි (එනම් මුහුදු සත්ව ආහාර මිලට ගැනීම හෝ විකිනීම සහ ක්ෂුද්‍ර ඉන්ධන පොලක් පවත්වාගෙන යාම වැනි දේ හි) නිරතව සිටියි.

# ශ්‍රී ලංකා නිල් කකුළු සංවර්ධන ව්‍යාපෘතියේ සහ ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ තත්ව වාර්තාව

ධීවර සංවර්ධන ව්‍යාපෘතිය මගින් 6 මසක අභ්‍යන්තර අගැයීම් ක්‍රියාවලියක් ජාත්‍යන්තරව පිළිගත් දිගුකල් පවත්නා මුහුදු සත්ව ආහාර සම්පත් තක්සේරු කිරීමක් 2015 දෙසැම්බර් දී ආරම්භ කරන ලදී. මෙම තක්සේරු කිරීම නිල නොවන / අභ්‍යන්තර ධීවර සංවර්ධන ව්‍යාපෘතිය වැඩිදියුනු කිරීමේ ව්‍යාපෘතිය මත පදනම් වී ඇත.

මෙම ප්‍රතිඵල මගින් පෙන්නුම් කරනුයේ මත්ස්‍ය අභිජනන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය දැනට සිටින්නේ 3 වන අදියරේ බවයි: ක්‍රියාවට නැංවීම්, වැඩිදියුනු කිරීමට උනන්දු කිරීම.

ඇම් ඇස් සී ඇගයීමේ ක්‍රමවේදයට අනුව මත්ස්‍ය අභිජනන ලකුණු ප්‍රමාණය V 20 (0.37) කි. ධීවර සංවර්ධන ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීමේ අගැයීමට අනුව මත්ස්‍ය අභිජනන ස්ථාන අසාර්ථක වන බවක් පෙන්නුම් කෙරේ.

අසුකරගත් මත්ස්‍යයින් මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානවලට එරෙහි මුහුදු සත්ව ආහාර අධීක්ෂණ නිර්ණායකයින්ට අනුව මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානවලට ලැබෙන සමස්ථ ලකුණු ප්‍රමාණය 2.12 (ප 2.0) කි. ධීවර සංවර්ධන ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අභ්‍යන්තර තක්සේරුවට අනුව පෙන්නුම් කරනුයේ ධීවර සංවර්ධන ව්‍යාපෘතිය අසාර්ථක බවයි. මෙනිසා මුහුදු සත්ව ආහාර අධික්ෂණය මගින් ශ්‍රී ලාංකික නිල් කකුළු නිෂ්පාදනවලින් පාරිභෝගිකයා වැලකී සිටිය යුතු බව නිර්දේශ කිරීමට ඉඩ ඇත.

**2016 වර්ෂයේ දී ධීවර සංවර්ධන ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යෑම:** ඉහත සඳහන් කරන ලද ශ්‍රී ලාංකික නිල් කකුළු අභිජනන වැඩි දියුණු කිරීම ජාතික ධීවර ආයතනයේ කකුළු කවුන්සලයේ නොමසුරු මූල්‍ය ආධාර නොමැතිව සිදු කළ නොහැක. ශ්‍රී ලංකා මුහුදු ආහාර අපනයනකරුවන්ගේ මූලික ආධාර සමග ධීවර සංවර්ධන ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නොමසුරු ලෙස දායක වූවෝ නම් *ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව* (FCU) සමග *ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ආර්ථික සංවර්ධනය තුලින් දේශීකයන් බල ගැන්වීමේ ව්‍යාපෘතිය* (LEED ව්‍යාපෘතිය) ද DFAR සමග *බෙංගාල බොක්ක විශාල සමුද්‍ර පරිසර පර්ධතිය තිරසායි ලෙස කළමනාකරණය සඳහා වූ ව්‍යාපෘතිය* ද *ධීවර සංවර්ධන ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය* සමග *ආසියානු පදනම* වෙති. ශ්‍රී ලංකා නිල් කකුළු සංවර්ධන ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම සඳහා අදාළ සේවක මණ්ඩලය විසින් දක්වන නිරන්තර සහයෝගය හා කරනු ලබන සියලුම උත්සාහයන් ඉවසා දරා සිටීම පිළිබඳව ධීවර සංවර්ධන ව්‍යාපෘතියයේ සාමාජිකයින් විසින් ප්‍රබල කෘතඥතාවයක් පුදකර සිටී.

2015 වර්ෂයේ දී නිල් කකුළු සංවර්ධන ව්‍යාපෘතිය සඳහා එක්ව මූල්‍යාධාර සපයනු ලබන්නේ චිකන් ඔෆ් ද සී සමාගම සමග සී .ස. ටැප්‍රොබේන් සීෆුඩ් ගෲප් (පුද්ගලික) සමාගම විසිනි. ඇල්පෙන්ස් මැරයින් (පුද්ගලික) සමාගම, සීලෝන් කැඩ් (පුද්ගලික) සමාගම, ඕඇල්එස් (පුද්ගලික) සමාගම හා ෆ්‍රොස් සිලෝන් (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකා නිල් කකුළු සංවර්ධන ව්‍යාපෘතියේ සාමාජිකයින් වෙති.

සිංහල, දෙමළ හා ඉංග්‍රිසි බසින් පල වන නිල් කකුළු තොරතුරු පත්‍රිකාවේ මෘදු පිටපත් හා ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ වැදගත් ලිපි ලේඛණ මුහුදු සත්ව ආහාර අපනයනකරුවන්ගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. වැඩිමනක් තොරතුරු සඳහා steve@pelagikos.lk වෙත විද්‍යුත් තැපැලක් යවා ලබා ගත හැකිය.